ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු උදය ගම්මන්පිල මහතා විසින්
2024 පෙබරවාරි මස 21 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2024 පෙබරවාරි මස 13 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[243 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල :** රු. 12.00 **තැපැල් ගාස්තුව :** රු. 150.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

**පූර්විකාව**

මීන් මතුවට 13 වන සංශෝධනය ලෙස හඳුන්වනු ලබන 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින්-

(අ) නවවැනි උපලේඛනයේ පළමු ලැයිස්තුවේ පළමු පරිශිෂ්ටයේ 12:1 අයිතමය සමග කියවිය යුතු 154උ(8) ව්‍යවස්ථාව අනුව වැරදි වැළැක්වීම, අනාවරණය කර ගැනීම සහ ඒ පිළිබඳ විමර්ශනය කිරීම ඇතුළු නීතිය සහ සාමය පිළිබඳ නීති සම්පාදනය සහ පාර්ලිමේන්තුව විසින් සම්මත කර ඇති නීති වෙනුවට නව නීති හඳුන්වා දීම ද පළාත් සභාවන්ට පවරා ඇති හෙයින් ද;

(ආ) නවවැනි උපලේඛනයේ පළමු ලැයිස්තුවේ පළමු පරිශිෂ්ටයේ 11:1 අයිතමය අනුව පොලීසියේ පළාත්බද අංශයේ ප්‍රධානියා වන නියෝජ්‍ය පොලිස්පතිවරයා පොලිස් බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් එම පළාතේ ප්‍රධාන ඇමතිවරයාට වගකිවයුතු අතර ඔහුගේ පාලනය යටතේ සිටිය යුතු හෙයින් ද;

(ඇ) 155උ(1)(ආ) ව්‍යවස්ථාව සමග කියවිය යුතු නව වැනි උපලේඛනයේ පළමු ලැයිස්තුවේ පළමු පරිශිෂ්ටයේ 4,6 සහ 9:1 අයිතමයන් අනුව පළාත් පොලිස් කොමිෂන් සභාවේ සාමාජිකයින් තිදෙනාගෙන් දෙදෙනකුම පළාතේ ප්‍රධාන අමාත්‍යවරයාගේ නාමයෝජනාවෙන් හෝ එකඟතාවය ඇතිව පත් කළ යුතු බැවින් පොලීසියේ පළාත්බද අංශයේ පොලිස් නිලධාරීන් බඳවා ගැනීම, මාරු කිරීම, උසස් කිරීම සහ විනය පාලනය පැවරී ඇති පළාත් පොලිස් කොමිෂන් සභාව දේශපාලනීකරණය වී ඇති හෙයින් ද;

(ඈ) නවවැනි උපලේඛනයේ පළමු ලැයිස්තුවේ පළමු පරිශිෂ්ටයේ 11 අයිතමය අනුව යම් පළාතක සේවය කරන ජාතික අංශයේ පොලිස් නිලධාරීන් ඒ පළාතේ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ විධානය සහ පාලනය යටතේ කටයුතු කළ යුතු අතර, එකී නියෝජ්‍ය පොලිස්පතිවරයා එම පළාතේ ප්‍රධාන ඇමතිවරයාට වගකිවයුතු අතර, ඔහුගේ පාලනය යටතේ සිටිය යුතු හෙයින් ද;

(ඉ) නවවැනි උපලේඛනයේ පළමු ලැයිස්තුවේ පළමු පරිශිෂ්ටයේ 12:2,12:3 සහ 12:4 යන අයිතමයන් සමඟ කියවිය යුතු 10:1 අයිතමය අනුව යම් පළාතක සේවය කරන ජාතික අංශයේ පොලිස් නිලධාරින් සාමාන්‍යයෙන් සාමාන්‍ය ඇඳුම් ඇඳ සිටිය යුතු අතර ඔවුන්ට නිල ඇඳුම් ඇඳිය හැක්කේ පළාත ඇතුළත මහජන සාමය ආරක්ෂා කිරීම සඳහා ප්‍රධාන අමාත්‍යවරයා විසින් ජාතික අංශයේ සහය ඉල්ලා සිටි අවස්ථාවක හෝ පළාත තුළ හදිසි තත්ත්වයක් ප්‍රකාශ කර ඇති අවස්ථාවක හෝ ප්‍රධාන අමාත්‍යවරයාගේ ඉල්ලීම මත අපරාධ පරීක්ෂණ දෙපාර්මේන්තුව විසින් යම් වරදක් පිළිබඳ විමර්ශනය කරන අවස්ථාවක හෝ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් යම් වරදක් පිළිබඳ විමර්ශනය කළ යුතු යැයි ප්‍රධාන ඇමතිවරයා විමසා නීතිපතිවරයාගේ අනුමැතිය ඇතිව පොලිස්පතිවරයා විසින් විධාන කරන අවස්ථාවක පමණක් වන හෙයින් ද;

(ඊ) නවවැනි උපලේඛනයේ පළමු ලැයිස්තුවේ පළමු පරිශිෂ්ටයේ 12:1 අයිතමය අනුව එහි උපලේඛනයේ දැක්වෙන වැරදි හැර සියළුම වැරදි වැළැක්වීම,අනාවරණය කර ගැනීම සහ ඒ පිළිබඳ විමර්ශනය කිරීම සම්බන්ධයෙන් ද අපරාධ නඩු විධාන සංග්‍රහ පනත ප්‍රකාර නීතිපතිවරයාගේ බලතල වලට යටත්ව ඒ වැරදි පිළිබඳ අදාළ අධිකරණ වල නඩු පැවරීම සම්බන්ධයෙන් ද බලය පොලිසියේ පළාත්බද අංශයට පවරා ඇති හෙයින් ද;

(උ) නවවැනි උපලේඛනයේ දෙවන ලැයිස්තුවේ දෙවන අයිතමයේ (ඔ) ඡේදයේ දැක්වෙන සීමා කිරීමට අනුව යම් පළාතකට අයත් පොලිස් හමුදාවක් සතු බලතල වෙනත් පළාත් සභාවකට ව්‍යාප්ත කිරීම කළ හැක්කේ එකී පළාත් සභාවේ කැමැත්ත මත පමණක් හෙයින් ද:

ඉන්දියානු අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 256 සහ 257 වගන්ති අනුව යම් ප්‍රාන්ත ආණ්ඩුවක් ජනරජයට එරෙහිව කටයුතු කරන අවස්ථාවේ දී ඊට මැදිහත් වීමට ජනරජයට බලතල ලබා දී ඇති අතර, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉන්දියානු ව්‍යවස්ථා ව්‍යුහය පදනම් කරගෙන ඇති නමුත් 154 ඔ ව්‍යවස්ථාවේ සීමිත විධිවිධාන ප්‍රමාණවත් අයුරින් එහි ඇතුළත් කර නොමැති හෙයින් ද:

නීතිය සහ සාමය සම්බන්ධයෙන් වූ පළාත් සභා බලතල ක්‍රියාත්මක කිරීම ජනරජයේ ජාතික ආරක්ෂාවට බරපතල තර්ජනයක් වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මෙම පනත විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යනුවෙන් හඳුන්වනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155උ ව්‍යවස්ථාව සහ නවවැනි උපලේඛනයේ පළමු සහ දෙවන ලැයිස්තු සංශෝධනය කිරීම

**2.** මින් මතුවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලෙස හඳුන්වා ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ-

(අ) 155 උ ව්‍යවස්ථාව-

(i) පළමු ඡේදයේ (ආ) අනුඡේදය පරිච්ඡින්න කිරීමෙන් ද;

(ii) තුන්වන ඡේදයේ (ඇ) උපඡේදයේ ''ජාතික අංශයේ සහ පළාත් අංශයේ''යන වචන ඉවත් කර ඒ වෙනුවට ''පොලීසියේ'' යන වචනය ආදේශ කිරීමෙන් ද,

සංශෝධනය කිරීමෙන් ද;

(ආ) නවවැනි උපලේඛනයේ පළමු ලැයිස්තුවේ (පළාත් සභා ලැයිස්තුවේ) පළමු අයිතමය පරිච්ඡින්න කිරීමෙන් ද;

(ඇ) නවවැනි උපලේඛනයේ පළමු ලැයිස්තුවේ (පළාත් සභා ලැයිස්තුවේ) පළමු පරිශිෂ්ටය පරිච්ඡින්න කිරීමෙන් ද;

(ඈ) නවවැනි උපලේඛනයේ දෙවන ලැයිස්තුවේ දෙවන අයිතමයේ (ඔ) ඡේදය පරිච්ඡින්න කිරීමෙන් ද;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මෙයින් සංශෝධනය කරනු ලබන්නේ ය.

**3.** යම් ව්‍යාකූලත්වයක් ඇති වීම වැළැක්වීම සඳහා-

(අ) පොලීසියේ ''ජාතික අංශය'' සහ ''පළාත්බද අංශය'' යනුවෙන් නොතිබිය යුතු අතර, ඒ අනුව යම් ලිඛිත නීතියක පොලීසියේ ''ජාතික අංශය'' සහ ''පළාත්බද අංශය''යනුවෙන් සඳහන් වන්නේ නම් එයින් ශ්‍රී ලංකා පොලීසිය අදහස් විය යුත්තේ ය;

(ආ) යම් ලිඛිත නීතියක පළාත් පොලිස් කොමිෂන් සභාව යනුවෙන් සඳහන් වන්නේ නම් එයින් 155අ ව්‍යවස්ථාවෙන් පිහිටුවා ඇති ජාතික පොලිස් කොමිෂන් සභාව අදහස් විය යුත්තේ ය.

පොලීසියේ පළාත්බද අංශය සම්බන්ධයෙන් යම් ව්‍යාකූලත්වයක් ඇතිවීම වැළැක්වීම

**4.** මෙම පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව